*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය*
*පස්වැනි කලාපය, ද්විතීය භාගය, 2010 ජනවාරි , 327-347*
*ISSN 1800-1459*

# සංවර්ධනය වන රටවල දරිද්‍රතාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

**එම්.ඩී.ජේ.ඩබ් විජේසිංහ**

*ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. අංක 02, බෙලිහුල්ඔය*

**සාරාංශය**

පසුගිය දශක කිහිපය පුරා ගෝලීයකරණය හා දරිද්‍රතාව අතර ඇති සම්බන්ධතාව නිරන්තරයෙන් සාකච්ඡාවට බඳුන් විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ ගෝලීයකරණය මගින් දරිද්‍රතාවට ඇති කර ඇති බලපෑම පිළිබඳ ව විග්‍රහයක යෙදීම යි. අධ්‍යයනය සඳහා ද්විතික දත්ත පදනම් කරගෙන ඇති අතර විශේෂයෙන් ලෝක සංවර්ධන වාර්තා මගින් එළි දක්වා ඇති දත්ත උපයෝගි කර ගෙන ඇත.

ගෝලීයකරණ ක්‍රියාදාමය තුළ සංවර්ධනය වන රටවල ආයෝජන සහ අපනයන වර්ධනය වුව ද කෘෂිකාර්මික භාණ්ඩවල මිල අවිනිශ්චිතතාවන්, ලෝක ආර්ථික අවපාත 'සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධිත රටවලට වඩා බාහිර ලෝකය මත යැපෙන තත්ත්වයක් නිර්මාණය වීම ඇතුළු ආර්ථික අවිනිශ්චිතතාවක් නිර්මාණය වීම බහුජාතික සමාගම්වල ක්‍රියාකාරීත්වයේ අසමානතාවන් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල තාක්ෂණික විෂමතාවන් මගින් රැකියා අධ්‍යාපන ඇතුළු සමාජ හා ආර්ථික අවස්ථාවන් පිළිබඳ ව තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම ආදිය හේතුවෙන් දරිද්‍රතාව වර්ධනය වී ඇත.

විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් ගෝලීයකරණයේ ප්‍රතිලාභ බෙදීයාමේ විෂමතාව හේතුවෙන් ප්‍රමාණවත් සනීපාරක්ෂක හා ජල පහසුකම් අහිමි වීම, ප්‍රතිශක්තිකරණය හීන වීම මන්ද පෝෂණ තත්ත්වයන් තොරතුරු වෙත ළඟා වීමට පවතින දුෂ්කරතාව හා පාසල් අධ්‍යාපනය අහිමි වීම මෙන් ම කාන්තාවන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා සඳහා සීමා කරමින් ශ්‍රමය සූරා කෑමට ලක් කිරීම, සෞඛ්‍ය පහසුකම් නොමැති වීමෙන් මාතෘ මරණ ඉහළ යාම මුඩුක්කුවල ජීවත් වන නාගරික ජනගහනය ඉහළ යාම ආදී විෂමතාවන් වර්ධනය වි ඇත. ඒ අනුව ගෝලීයකරණය දුප්පතුන්ට හිතකර වර්ධනයක් (pro poor growth) සහිත ව ක්‍රියාත්මක වී නොමැත.

**කේන්ද්‍රීය වචන:** ගෝලීයකරණය, දරිද්‍රතාව, සංවර්ධනය වන රටවල්

## හැඳින්වීම

විසිවන සියවසේ ලෝකයේ ප්‍රබල ලෙස අවධානය දිනාගත් සංකල්පයක් වන ගෝලීයකරණය නැතහොත් ජගත්කරණය (Globalization or Internationalization) වෙළෙඳාම හා තාක්ෂණික වර්ධනය මගින් ලෝකයේ රටවල් අතර අන්තර් සබඳතාව වර්ධනය වීමේ ක්‍රියාවලිය ලෙස හැඳින්විය හැකි ය. ලෝක බැංකුවේ නිර්වචනයට අනුව ගෝලීයකරණය යනු ලොව වටා විවිධ සමාජයන්හි සහ ආර්ථික මට්ටම්වල ඒකාබද්ධතාව වර්ධනය වීම වේ (What is Globalization, 2008). Laurence (2003)

ගෝලීයකරණය නිර්වචනය කරනුයේ පුද්ගලයන් අතර, ආයතන අතර, සහ විවිධ ජාතීන්ට අයත් රජයන් අතර අන්තර්ක්‍රියාකාරීත්වය සහ ඒකාබද්ධතාව වැඩි දියුණු වීම ලෙස ය . ඒ අනුව ගෝලීයකරණය ආර්ථික, වෙළෙඳාම, තාක්ෂණික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික අන්තර් සබඳතාවන් ප්‍රවර්ධනය කරන අතර එහි එක් මූලික ප්‍රතිඵලයක් වන්නේ ගෙවුම් ශේෂ ගිණුම තුළ (ඇතුළත් සියලු ම භාණ්ඩ හා සේවා නිදහසේ සංචලනය වීම වේ.

ගෝලීයකරණය අවධි දෙකක් ඔස්සේ වර්ධනය වූ සංකල්පයකි. 19 වන සියවස ගෝලීයකරණයේ පළමු අවධිය ලෙසත් විසි වන සියවස ගෝලීයකරණයේ දෙවැනි අවධිය ලෙසත් හඳුන්වයි. පළමු අවධිය තුළ නැව් හා දුම්රිය ගමනා ගමන පහසුකම් දියුණු වීමත් සමග ප්‍රවාහන පිරිවැය අඩු වී වෙළෙඳාම් කටයුතු දියුණු විය. ටෙලිග්‍රාෆ් වැනි සංනිවේදන ක්‍රම සොයා ගැනීම ද ඊට ප්‍රබල පිටුවහලක් වූ අතර රටවල අතර වෙළෙඳාම් හා සංක්‍රමණ වර්ධනය වී නව සම්බන්ධතා බිහි වී ලෝකය ඉතා සමීප ව කටයුතු කිරීම ආරම්භ විය. එසේ වුව ද පළමු ලෝක යුද්ධය ආරම්භ වීම, සංක්‍රමණ නීති රීති පැනවීම මුල්‍ය අර්බුද ආර්ථික පරිහානි ආදි කරුණු නිසා ගෝලීයකරණ පළමු අවධිය 19 සියවස අගභාගයේ දි නිමාවට පත් විය.

ගෝලීයකරණයේ දෙවැනි අවධිය ආරම්භයට ප්‍රබලතම හේතු සාධක වූයේ දෙවන ලෝක යුධ සමයත් සමග නව තාක්ෂණික සොයා ගැනීම් මගින් ප්‍රවාහන පිරිවැය අඩු වීම, විශාල ලෙස සන්නිවේදන හා තොරතුරු පිරිවැය අඩුවීම සහ භාණ්ඩ හා සේවා මත බදු හා බදු නොවන බාධාවන් ඉවත් කිරීම ය. මෙලෙස වර්ධනය වෙමින් පැවති ගෝලීයකරණ ක්‍රියාදාමය වර්තමානය වන විට නැවත ආපසු හැරවිය නොහැකි බලවේගයක් බවට පත් ව ඇත.

ගෝලීයකරණය සෑම රටක ම ආර්ථික, සමාජ, සංස්කෘතික සහ දේශපාලන යන සියලු අංශවලට විශාල ලෙස බලපෑම් ඇත. එහි දී පුද්ගයින්ගේ ආර්ථික සහ සමාජ තත්ත්වයට විශේෂයෙන් දරිද්‍රතාව පිටුදැකීමෙහිලා ගෝලීයකරණයේ බලපෑම් ප්‍රමුඛ මාතෘකාවක් බවට පත් ව ඇත.

දරිද්‍රතාව පිළිබඳ නිර්වචන මතභේදකාරී වුව ද එය සරල ව නිර්වචනය කරනුයේ මූලික මිනිස් අවශ්‍යතාවන් සපුරා ගැනීමට නොහැකි තත්වයකි. එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක බැංකුවේ නිර්වචන අනුව දිනකට ඇමරිකානු ඩොලර් (ඇ:ඩො:) එකකට අඩුවෙන් උපයන ජනගහනය දරිද්‍රතා රේඛාවට අයිති වේ. එහ දී දිනකට ඇ:ඩො: එකකට වඩා උපයන ජනගහනය අන්ත දුගී (extrem poverty) මට්ටමට අයත් වන අතර දිනකට ඇ:ඩො: දෙකකට වඩා උපයන ජනගහනය මධ්‍යම දුගී (moderate poverty) මට්ටමට අයත් වේ. සමාජ විද්‍යාඥයින්ට අනුව දරිද්‍රතාව යනු ජීවත් වීමට අත්‍යවශ්‍ය දෑ එනම් ආහාර, ඇඳුම්, නිවාස හා ජලය අවම වශයෙන් සපුරා ගත නොහැකි වීම යි. ලෝක බැංකුව විසින් රටවල් 23 ක පුද්ගලයින් 20000 කට වැඩි

ප්‍රමාණයක් යොදාගනිමින් (voices of the poor) සිදු කරන ලද පර්යේෂණයේ දී දරිද්‍රතාවට අදාළ සාධක කිහිපයක් හඳුනාගෙන ඇත. එනම් අවිනිශ්චිත ජීවන මාර්ග, අවතැන් වීම, භෞතික සීමාවන්, සමාජ සම්බන්ධතාවන් පිළිබඳ ගැටළු ස්ත්‍රීපුරුෂ සම්බන්ධතාවන්, අනාරක්ෂිත භාවය, දුර්වල සමාජ සංවිධාන ආදිය එකී සාධක වේ.

ගෝලීයකරණය හා දරිද්‍රතාව අතර ඇති සම්බන්ධතාවේ දී ලිබරල්වාදි ආර්ථික විද්‍යාඥයෝ ගෝලීය වෙළෙඳාම ධනවතුන්ට පමණක් නොව දුප්පතුන්ට ද යහපතක් ඇති කරන බව දක්වති. නව ලිබරල් ආර්ථික න්‍යායන්ට අනුව වඩා විවෘත ආර්ථිකයන් ඉතා වේගයෙන් දියුණුවට පත් වේ. තීරු බදු, රේගු බදු, සලාක ක්‍රම ඉවත් කරමින් නිදහස් වෙළෙඳාමට අවතීර්ණ වීමෙන් දුප්පතුන්ට අඩු මිලට ආනයන භාණ්ඩ ලබා ගැනීමට හැකි වීම, සෘජු විදේශ ආයෝජන රට තුළට ගලා එමෙන් රැකියා අවස්ථා වර්ධනය වීම, අපනයන වර්ධනය වීම මගින් දළ දේශීය නිෂ්පාදනය වර්ධනය වීමට ඉඩ සැලසෙන බව නව ලිබරල්වාදීන්ගේ මතය යි.

Agenor (2002) සංවර්ධනය වෙමින් පවතින රටවල දුප්පතුන්ට ගෝලීයකරණයෙන් ඇති වී ඇති බලපෑම විමර්ශනය කර ඇත. එහි දී ඔහුගේ නිගමනය වී ඇත්තේ ගෝලීය ප්‍රවාහය අවම ලෙස ක්‍රියාත්මක වන අවස්ථාවේ දුප්පතුන්ට වැඩි බලපෑමක් කළ ද ඉහළ ක්‍රියාකාරිත්වයක දී දුගිභාවය අවම කිරීමට කටයුතු කරන බව යි. ලෝක බැංකුවේ ප්‍රතිපත්ති පර්යේෂණ පත්‍රිකාවක් සඳහා සිදු කරනු ලැබූ Globalization poverty and inegibility since 1980 හි සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික දත්ත සංසන්දනය කරමින් ගෝලීයකරණය දරිද්‍රතාව පිටුදැකීමෙහිලා ධනාත්මක බලපෑම් එල්ල කරන බව විග්‍රහ කර ඇත. 2002 දි ලෝක බැංකුව විසින් ප්‍රකාශිත Globalization Growth and Poverty හි ඔවුන් විසින් දක්වන්නේ ගෝලීයකරණය දරිද්‍රතාව අඩුකිරීමට හේතු වන බව ය (Dollar, 2004). Heshmati (2006) සංවර්ධනය වෙමින් පවතින රටවල් පාදක කර ගනිමින් ගෝලීයකරණය, අසමානතාව සහ දරිද්‍රතාව අතර සම්බන්ධතාව අධ්‍යයනය කර ඇත. එහි දී හරස්කඩ ප්‍රතිපායන විශ්ලේෂණය යොදා ගනිමින් ගෝලීයකරණය දරිද්‍රතාව හා ආදායම් විෂමතාව පිළිබඳ ව සුවිශේෂී සබඳතාවක් ඇති බව පෙන්වා දී ඇත. එනම් ගෝලීයකරණය, දරිද්‍රතාව හා ආදායම් විෂමතාව අඩු කිරීමට හේතුවන බව ඔහු අවධාරණය කර ඇත- සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතාව පිටුදැකීමෙහිලා ගෝලීයකරණයේ බලපෑම පිළිබඳ විවිධ මත ඇති වීමට හේතු කාරණා අධ්‍යයනය කර ඇත. එහි දී ගෝලීයකරණය සම්බන්ධයෙන් පවත්නා අගයන්, විශ්වාසයන් පිළිබඳ සාකච්ඡා කොට ඇති අතර දේශපාලන හා ආර්ථික ඒකරාශීකරණය ප්‍රධාන ලෙස ගෝලීයකරණයට එරෙහි ව නැගී සිටීමට බලපා ඇති බව විග්‍රහ කර ඇත (Aisbett, 2004). Sindzingre (2005) දරිද්‍රතාවට ගෝලීයකරණයේ බලපෑම පිළිබඳ අධ්‍යනයක් සිදුකර ඇති අතර සමාජ, ආයතන හා ප්‍රතිමාන ඉතා තීරණාත්මක ලෙස දරිද්‍රතාවට බලපෑම් සිදු කරනු ලබන බව පෙන්වා දී ඇත. එමෙන් ම දරිද්‍රතාවේ ප්‍රයෝගයන් නිර්මාණය කිරීමට සමාජ ආයතනික හා රාජ්‍ය ප්‍රතිපත්ති අතර සබඳතාව විශ්ලේෂණය කර තිබේ. Heshmati (2005) ගෝලීයකරණය, දරිද්‍රතාව හා ආදායම් අසමානතාව පිළිබඳ අධ්‍යයනය කර ඇත. එහි දී ප්‍රතිපායන විශ්ලේෂණයක් සිදු කර ඇති අතර ගෝලීයකරණය ආදායම් අසමානතාව

අතර සෘණාත්මක සම්බන්ධයක් පවතින බව පෙන්වා දී ඇත. Globalization Growth and Poverty: the missing link නැමති පර්යේෂණ පත්‍රිකාව සිදුකළ Ibrahim (2008) දක්වන ආකාරයට දරිද්‍රතාව අවම කිරීමට ඉහළ ආර්ථික වර්ධනයක් අත්‍යවශ්‍ය නොවේ. එනම් ගෝලීයකරණය ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය සාධකයක් නොවේ. දරිද්‍රතාව තුරන් කිරීමට පුළුල් පදනම් වර්ධන ප්‍රතිපත්ති ප්‍රවේශයකට වඩා පුළුල් පරාසයක් සහිත ප්‍රතිපත්ති ප්‍රවේශය වඩා ඵලදායි වේ. ව්‍යාපාර ආචාරධර්ම ජර්නලයට Globalizalia and Poverty:Oxymoron or new possibilities නමින් සිදුකළ පර්යේෂණයේ දී 1990-2004 කාල වකවානුවේ දී ආනයන හා අපනයන ඉහළ ගිය ද භූගෝලීය කලාප අතර ආර්ථික වර්ධනයේ අසමානතාවක් පෙන්නුම් කරන බව සොයා ගෙන ඇත. එම නිසා ගෝලීය වෙළෙඳාම මගින් සංවර්ධනය වෙමින් පවතින රටවල ඵලදායිතාව හා ප්‍රමාණවත් අන්දමින් දරිද්‍රතාව අඩුකිරීමට සමත් ව නැති බව පෙන්නුම් කරයි (Ronald and Justine, 2009). Harrison (2006) ගෝලීයකරණය මගින් දුප්පතුන් අතර දිනන්නන් හා පරදින්නන් නිර්මාණය කරන බව යි. එනම් වෙළඳාම සහ මූල්‍ය ඒකාබද්ධතාව මගින් සමහර දුගී පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය පහත හෙළන බවත් ඔවුන් සඳහා සුභ සාධන වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු බවත් ය. Trade Liberalization, Poverty and inequality Evidence From Indian District නැමැති පර්යේෂණ පත්‍රිකාව මගින් 1991 සිට ඉන්දියාව විසින් අනුගමනය කළ වෙළඳාම නිදහස්කරණ ප්‍රතිපත්ති මගින් ප්‍රාන්තවල දරිද්‍රතාවට සහ ආදායම් විෂමතාවට සිදු වී ඇති බලපෑම පැහැදිලි කරයි. එහි දී ග්‍රාමීය දිස්ත්‍රික්කවල වඩා නිදස්කරණය වූ කර්මාන්ත දෙස අවධානය යොමු කිරීමේ දී වෙළඳාම නිදහස්කරණය මගින් දරිද්‍රතාව අවම කිරීමට කර ඇති බලපෑම ඉතා කුඩා ය (Petia, 2005). Afriyie (2008) ගෝලීයකරණ ප්‍රතිඵල මගින් දරිද්‍රතාව අවම කිරීමට හේතු වේ ද යන්න අධ්‍යයනය කර ඇති අතර එහි දී ගෝලීයකරණය දරිද්‍රතාව අවම කරන බව පොදුවේ විශ්වාස කළ ද එය නිවැරදි නොවන බව අවධාරණය කරයි.

Globalization, Inequality and Poverty Relationships : A cross Country Evidence නැමති පර්යේෂණ පත්‍රිකාව මගින් රටවල් 65 ක් පදනම් කරගනිමින් නව ගෝලීයකරණ දර්ශකයක් (Globalization Index) නිර්මාණය කරන ලදී. එහි දි හරස්කඩ දත්ත විශ්ලේෂණය (Cross- Section regression analysis) අනුව ගෝලීයකරණය, දරිද්‍රතාව ආදායම් විෂමතාව අතර දැඩි සබඳතාවක් පවති. එනම් ගෝලීයකරණය දරිද්‍රතාව හා ආදායම් විෂමතාව අඩු කරයි. එහෙත් රේඛීය නොවන විශ්ලේෂණ (Non linear analysis) මගින් ගෝලීයකරණය මගින් දරිද්‍රතාව අවම කිරීමට ලැබෙන දායකත්වය අවම බව යි (Marcel and Heshmali, 2006).

ඉහත පර්යේෂණ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී බොහෝ විට ගෝලීයකරණයේ ධනාත්මක සහ සෘණාත්මක බලපෑම වෙන් වෙන් ව අධ්‍යයනය කර ඇති බව පැහැදිලි වේ. එමෙන් ම බොහෝ විට ආර්ථිකමය සාධක පමණක් සැලකිල්ලට ගෙන ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ ගෝලීයකරණය මගින් දරිද්‍රතාව කෙරෙහි ඇති කර ඇති බලපෑම පිළිබඳ ව විග්‍රහයක යෙදීම වේ. එහි දී රටවල් අතර සහ රටවල් තුළ ම ඇති වී තිබෙන සමාජ ආර්ථික බලපෑම යන අංශ දෙක ම පිළිබඳ විග්‍රහ කෙරේ.

## විශ්ලේෂණය

ගෝලීයකරණ ප්‍රවාහයට ලොව සියලු රටවල් එකාබද්ධ වී ඇත. වෙළෙඳාම්, ආයෝජන හා ආර්ථික ප්‍රවර්ධනයට ගෝලීයකරණය මනා පිටුවහලක් ලෙස සලකමින් සංවර්ධනය වෙමින් පවතින රටවල් තම ආර්ථිකයන් වඩ වඩාත් තරගකාරි ලෙස විවෘත කරමින් සිටි. එහෙත් සංවර්ධනය වෙමින් පවතින රටවල විවිධ මූල්‍ය අර්බුදයන් සමාජ හා ආර්ථික ගැටළු දිනෙන් දින ඉහල යමින් පවතින බවත් ගෝලීයකරණ ප්‍රවාහයට සියළු දෙනා තව දුරටත් එකතු විය යුතු බවටත් තර්ක කරන්නෝ සිටිති. එවැනි පසුබිමක් යටතේ ගෝලීයකරණය ක්‍රියාදාමය මගින් දරිද්‍රතාවට සිදු වී ඇති බලපෑම පිළිද ව මත ගැටුම් පවති.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ද්විතික දත්ත පදනම් කරගෙන ඇති අතර විශේෂයෙන් ලෝක සංවර්ධන පිළිබඳ වාර්තා මගින් එළි දක්වා ඇති දත්ත උපයෝගි කර ගෙන ඇත. එහි දී ගෝලීයකරණය ආර්ථික වර්ධනයට කටයුතු කරන ආකාරයත් දරිද්‍රතාව වර්ධනය වීමට බලපා ඇති ආකාරය පිළිබඳ දත්ත භාවිත කර ඇත.


එහි දී ලෝක බැංකුව හා එක්සත් ජාතීන් අතුළු ජාත්‍යන්තර සංවිධාන මගින්ප්‍රකාශයට පත් කර ඇති මූලාශ්‍රයන් රැසක් භාවිත කරන ලදී.

දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රමවේදය භාවිත කර ඇති අතර දත්ත වගු ප්‍රස්තාර ආදිය මගින් විස්තරාත්මක ව විග්‍රහ කර ඇත.

## සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම්

ගෝලීයකරණයේ බලපෑම් අධ්‍යයනයේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, අයෝජන, අපනයන වර්ධනය ආදී ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් ඉතා වැදගත් වේ. එනම්, ගෝලීයකරණය සමග රටවල් වඩ වඩාත් ඒකරාශී වීමේ දී ඉතා ප්‍රබල ව සාර්ව ආර්ථික විචල්‍යයන්ට බලපෑම් එල්ල වේ.


අපනයන වර්ධනය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට දායක වන ප්‍රබල සාධකය වේ. විදේශ විනිමය ඉපයීම් වර්ධනය කර ගැනීම මගින් ආර්ථිකයන්ට ජාතික ආදායම වර්ධනය කර ගැනිමටත් ගෙවුම් ශේෂයේ වෙළඳ ගිණුම්වල ඇති වන සංකූලතාවන් මඟහරවා ගැනීමටත් එය ප්‍රබල පිටිවහලක් වේ. වෙළෙඳාමේ දී ද විශේෂයෙන් අපනයන අංශය තුළ සංවර්ධනය වෙමින් පවතින ආසියාව විශාල දියුණුවක් ලබා ගෙන ඇත (රූප සටහන 1).




**රූප සටහන 1: අපනයන අගයන්**

Source: World Bank Report 2008

ආයෝජන වර්ධනය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට ප්‍රබල දායකත්වයක් සපයන අනෙක් සාධකය වේ. ගෝලීයකරණය විදේශ ආයෝජන වර්ධනයට ඉතා වැදගත් පිටිවහලක් වන අතර විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල යටිතල පහසුකම් සංවර්ධනයට එනම් විදුලිය, සන්නිවේදන, ප්‍රවාහනය හා මුල්‍ය ක්ෂේත්‍රය දියුණුවීමට උපකාරි වන අතර ආර්ථිකයට හිතකර ගෙවුම් ශේෂ තුලනයත් පවත්වා ගැනීමට ද හැකියාව ලැබේ. ගෝලීයකරණය තුළ ආයෝජන ප්‍රවාහය 2 රූප සටහනනේ දක්වා ඇති පරිදි සංවර්ධනය වන ආසියාව ඉහළ වර්ධන වේගයක් අත්පත් කරගෙන ඇත. එමෙන් ම විශාල වශයෙන් සංවර්ධිත රටවලට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල විදේශ ආයෝජනවල වර්ධනයක් දක්නට ලැබේ.





**රූප සටහන 2: ආයෝජන වර්ධනය**

Source: World Bank Report 2008

1980-2008 කාල පරිච්ඡේදයේ ලෝකයේ ප්‍රධාන ආර්ථික කලාපවල දළ දේශීය නිෂ්පාදිතයේ උච්චාවචනය 3 රූප සටහන මගින් පැහැදිලි වේ. වෙළඳ චක්‍ර න්‍යායට යටත් ව ආර්ථික කලාප උච්චාවචනයන්ට ලක්වෙමින් විවිධ ආර්ථික වර්ධන වේගයන්

අත්පත් කරගෙන ඇත. අප්‍රිකාව, උපසහරා අප්‍රිකාව සහ සංවර්ධනය වෙමින් පවතින ආසියානු කලාපය සංවර්ධිත රටවලට වඩා ඉහළ වර්ධන වේගයක් අත්කර ගෙන ඇති අතර විශේෂයෙන් සංවර්ධනය වන ආසියාව 1980-2008 කාල පරිච්ඡේදය තුළ ම සහ උපසහරා රටවල් 2000 වර්ෂයෙන් පසු ලෝක නිෂ්පාදිත වර්ධනයට වඩා ඉහළ අගයක් ගෙන ඇත. එබැවින් ගෝලීයකරණය මගින් සංවර්ධිත රටවල ආර්ථික වර්ධනයට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල් ආයෝජන සහ අපනයන වර්ධනය කර ගනිමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගෙන ඇත.




**රූප සටහන 3: දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**

Source: World Bank Report 2008

## දරිද්‍රතාව වර්ධනය වීම


සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතාව අවම කිරීමට ගෝලීයකරණය ප්‍රබල ව දායක වී නොමැති බව ආදායම් වර්ධනයේ හා ව්‍යාප්තියේ විෂමතාවන් පිළිබඳ විමර්ශනය කෙරෙන් තහවුරු වේ.

**වගු අංක 1: දුගී රේඛාව % (1990 2004)**

| කලාප | 1990 | 2004 |
|---|---|---|
| උපසහරා අප්‍රිකාව | 19.5 | 17.5 |
| දකුණු ආසියාව | 11 | 6.7 |
| ලතින් ඇමරිකාව සහ කැරිබියන් දූපත් | 3.5 | 3 |
| නැගෙනහිර ආසියාව | 8.9 | 2.1 |
| ගිනිකොණ ආසියාව | 5.1 | 1.5 |
| බටහිර ආසියාව | 0.4 | 0.9 |
| උතුරු අප්‍රිකාව | 0.5 | 0.2 |
| සංවර්ධනය වන කලාප | 9.3 | 5.4 |

Source: Millenium Development Goals Report 2007

Millenium Development Goals Report (2007) ලෝකයේ සහ විවිධ කලාපවල දිනකට ඇමරිකානු ඩොලර් 1.25ක ට පහළ ආදායම් උපයන ජනගහන ප්‍රතිශතය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත. නමුත් උපසහරා අප්‍රිකාව, දකුණු හා නිරිත දි. ආසියාව වැනි කලාපවල දරිද්‍රතාව තව දුරටත් ඉහළ අගයක් ගනී (වගුව 1).




**රූප සටහන 4: ජාතික ආදායමෙන් දුප්පත් ම ජන කොටස් භුක්ති විඳින ප්‍රමාණය**
Source: Millenium Development Goals Report 2007

ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ විෂමතාවකින් තොර ව බෙදී යා යුතු වුවත් සංවර්ධනය වන රටවල් තුළ මෙන් ම රටවල් අතර ද අසමාන ව බෙදී ගොස් ඇත. 1999-2004 කාල වකවානුව තුළ සංවර්ධනය වන කලාපයේ ජනගහනයෙන් දුප්පත්ම 5% ජාතික ආදායමෙන් හිමි කරගන්නා කොටස 4.6 % සිට 3.9% දක්වා අඩු වී ඇත. නැගෙනහිර ආසියාවේ දුප්පත් ම පුද්ගලයින් අතර ආදායම් විෂමතාව ඉතා ශීඝ්‍ර ලෙස අඩු වී ඇත. නමුත් ලතින් ඇමරිකාව, කැරිබියන් සහ උපසහරා අප්‍රිකා රටවල ආදායම් විෂමතාව ඉතා ඉහළ අගයක පවති. අප්‍රිකා මහද්වීපයේ දිනකට ඇ:ඩො: 1 ක් හෝ ඊට වඩා අඩුවෙන් උපයන පුද්ගලයන් 1960 දි 56% ක් වූ අතර 1990 දි 65% දක්වා වර්ධනය වී ඇත. ආර්ජන්ටිනාවේ ජනගහනයෙන් භාගයකට වඩා වැඩි පිරිසක් දරිද්‍රතාවෙන් පෙළෙති. තෙල් අපනයනයෙන් පසුගිය දශක දෙක තුළ ඇ:ඩොලර් බිලියන 300ක අපනයන ආදායමක් නයිජීරියාව උපයනු ලැබුව ද 2/3 ක පුද්ගලයෙ ප්‍රමාණයක් දිනකට ඇ: ඩො: 1ට වඩා අඩුවෙන් උපය යි (රූප සටහන 4).

දරිද්‍රතාව හේතු කොට ගෙන අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා මෙන් ම ආහාර හිඟතාවන්ට මුහුණ පාන පුද්ගලයින්ගේ කායික හා මානසික දුබලතා නිසා ජීවන තත්වය පහළ මට්ටමක පවතී. එමෙන් ම සමාජ අරගලයන් හා සිවිල් යුද්ධ ඇති වීමටත් දරිද්‍රතාව මූලික සාධකයක් වී ඇත. මේ අනුව තම මූලික අවශතාවන් සපුරා ගැනීමට නොහැකි ව දුක් විඳින ජනගහනය ඉතා විශාල බැවින් ගෝලීයකරණය දරිද්‍රතාව අවම කිරීමට ධනාත්මක බලපෑමක් සිදු කර නැත.

2 වගුව මගින් දක්වා ඇති පරිදි සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල ඒක පුද්ගල ආදායම් පරතරය ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. ධනවත් කාර්මික රටක් වූ ස්විට්සර්ලන්තය හා දුගී රටක් වන මොසැම්බික් රට අතර ඒක පුද්ගල ආදායම් පරතරය 400:1 ක් වේ. ගෝලීයකරණ ප්‍රවාහය තුළ රටවල් තම නිෂ්පාදන, ආයෝජන වර්ධනය කර ගැනීමට කටයුතු කළ ද ආදායම් විෂමතාව අවම වී නැත.

**වගු අංක 2: ඒක් පුද්ගල ආදායම් පරතරය**

| වර්ෂය | පරතරය |
|---|---|
| 1820 | 3:1 |
| 1913 | 11:1 |
| 1950 | 35:1 |
| 1973 | 44:1 |
| 1992 | 72:1 |

Source: World Bank Report 2008

එමෙන් ම 3 වගුව අනුව පහළ ආදායම් ලබන කුටුම්භවලට සාපේක්ෂ ව 1979-2005 අතර කාලය තුළ මධ්‍ය ආදායම් ලබන කුටුම්භවල ආදායම් වර්ධනය 3 ගුණයකට ආසන්න වන අතර ඉහළ ආදායම් ලබන කුටුම්භවල ආදායම් වර්ධනය 6 ගුණයකට ආසන්න වේ. ගෝලීයකරණය සංවර්ධනය වෙමින් පවතින රටවල තවදුරටත් දරිද්‍රතාවේ විෂමතාව වර්ධනය කිරීමට දායක වී ඇත.

**වගු අංක 3: කුටුම්භ අතර ආදයම් වර්ධනය 1979-2005**

| ආදයම් කාණ්ඩය | වර්ධනය |
|---|---|
| ඉහළ ආදයම් ලබන කුටුම්භ | 80 % |
| මධ්‍ය ආදයම් ලබන කුටුම්භ | 21 % |
| පහළ ආදයම් ලබන කුටුම්භ | 6 % |

Source: World Bank Report 2008

## දරිද්‍රතාව වර්ධනය සඳහා බලපාන සාධක

ගෝලීයකරණ ක්‍රියාදාමය තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල් ආයෝජන සහ අපනයන වර්ධනය කර ගනු ලැබුව ද එම ප්‍රතිලාභ අභ්‍යන්තරයට ගලා යෑම පිළිබඳ අධ්‍යනයේ දී රටවල් තුළ ආර්ථික හා සමාජීය අංශවල විෂමතාවන් වර්ධනය වී ඇත.

විශේෂයෙන් මෑත දශකය තුළ චීනය තම අපනයන වෙළඳාම ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය කර ගත්ත ද එහි ප්‍රතිලාභය බිලියන 1.2 ක් වූ ජනගහයෙන් මිලියන 800 ක් පමණක් ප්‍රතිලාභ භුක්ති විඳිති. උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම (1994) හේතුවෙන් මෙක්සිකෝවේ අපනයන තුන් ගුණයකින් වර්ධනය වුවත් එහි ජනගහනයෙන් 50% ක් දරිද්‍රතාවෙන් පෙළෙති.

චීනය ඉන්දියාව සහ ඉන්දුනීසියාව ගෝලීයකරණ ප්‍රවාහය මගින් ඉතා විශාල ප්‍රතිලාභ ලබාගත් රටවල් අතර කැපී පෙනේ. පහත 4 වගුවට අනුව එම රටවල 1990 - 2005 කාල වකවානුව තුළ දුගී රේඛාව ශීඝ්‍ර ලෙස පහත වැටී තිබුණ ද ගිණි සංගුණකය අනුව ග්‍රාමීය හා නාගරික ආදායම් විෂමතාව තවදුරටත් වර්ධනය වී ඇත.

වගු අංක 4: ග්‍රාමීය හා නාගරික දුගීභාවය

| | | දුගී රේඛාව | | ගිණි සංගුණකය | |
|---|---|---|---|---|---|
| රට | වර්ෂය | නාගරික | ග්‍රාමීය | නාගරික | ග්‍රාමීය |
| චීන | 1990 | 05 | 27 | 26 | 31 |
| | 2005 | 0 | 0 | 35 | 36 |
| ඉන්දියාව | 1993 | 11 | 14 | 34 | 29 |
| | 2004 | 10 | 11 | 38 | 30 |
| ඉන්දුනීසියාව | 1990 | 15 | 16 | 35 | 26 |
| | 2005 | 04 | 05 | 40 | 30 |

Source : Asia and Pacific Annual Statistical Book 2008

විශේෂයෙන් 1 රූප සටහනේ නිරූපණය වන පරිදි 1986-2008 කාල පරිච්ඡේදය තුළ අපනයන අගයන් වර්ධනය වුව ද විවිධ උච්චාවචනයන්ට ලක් වී ඇත. කෘෂි කාර්මික භාණ්ඩවල මිල අවිනිශ්චිතතාවත්, ලෝක ආර්ථික අවපාත වැනි හේතු පාදක කරගනිමින් අපනයන අගයන් හා ප්‍රමාණයන් වෙනස් වී ඇත. වර්තමානය වන විට ලෝක ආර්ථික අවපාතය හේතුවෙන් ඉදිරි වර්ෂ කිහිපය තුළ අපනයන වර්ධනය පහළ යෑමේ ප්‍රවණතාවක් 1 රූප සටහනින් පුරෝකථනය කළ හැකි අතර ගෝලීයකරණ ප්‍රවාහයට වඩාත් විවෘත ආර්ථිකයන්ට විශේෂයෙන් කුඩා දේශීය වෙළඳපලක් සහිත සංවර්ධනය වන රටවල්වලට එය තියුණු ලෙස බලපානු ඇත. මේ හේතුවෙන් සංවර්ධනය වන රටවල සේවා වියුක්තතා තත්වයන් නිර්මාණය වී දරිද්‍රතාව තවදුරටත් වර්ධනය වේ.

එමෙන් ම විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමේ අරමුණින් සංවර්ධනය වන රටවල් තම ආර්ථිකයන් වඩ වඩාත් ලිහිල්කරණයට එනම්, රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය, ප්‍රාග්ධන ගිණුම් වඩාත් විවෘත කිරීම, ආකර්ෂණීය පොළී අනුපාත

පවත්වා ගෙනයාම ආදියට පෙළඹී ඇත. එහි භායානක ප්‍රතිඵලය වන්නේ, ආර්ථිකය තුළ ආර්ථික බුබුළු (economic bubbles) ඇති වී ක්ෂණික ව නැවත විදේශ ආයෝජන ඉවත් කර ගැනීම වැනි තත්ත්වයන් නිර්මාණය වීමෙන් සංවර්ධනය වන රටවල අර්බුද ඇති වී ආර්ථිකයන් ඉතා දරුණු අවපාතයන්ට මුහුණ දීමට සිදුවේ. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධිත රටවල වඩා බාහිර ලෝකය මත යැපෙන තත්ත්වයක් නිර්මාණය වීම මගින් ආර්ථිකයන් අවපාත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වී ඇති බව 3 රූප සටහනේ උච්චාවචන මගින් පැහැදිලි වේ. එනම්, ආර්ථික අවිනිශ්චිතතාවක් නිර්මාණය වීම කෙරෙන් දුගී ජනයාට තව තවත් දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු වේ. විශේෂයෙන් අග්නිදිග ආසියාවේ 1996-99 කාලය තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වර්ධනය පහළ අගයක් ගනිමින් දරිද්‍රතාව වර්ධනය වී ඇත.

බහුජාතික සමාගම්වල ක්‍රියාකාරීත්වයේ අසමානතාවන් හේතුවෙන් ද සංවර්ධනය වෙමින් පවතින රටවල පුද්ගලයින්ගේ දරිද්‍රතාව තවදුරටත් වර්ධනය වීමට ප්‍රබල ව දායක වී ඇත. වසර 2000 දී The Mobile නැමති සමාගම වාර්ෂික විකුණුම් හා එකතු කළ අගය මත ලොව විශාලතම බහු ජාතික සමාගම බවට පත්ව ඇත. 5 වගුවෙන් එම ආයතනයේ විකුණුම් සහ එකතු කළ අගයට සාපෙක්ෂ ව රටවල් කිහිපයක දළ දේශීය නිෂ්පාදිතය දක්වා ඇති අතර එම දත්ත අනුව එක් බහු ජාතික සමාගමක මුළු නිෂ්පාදිතය බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල දළ දේශීය නිෂ්පාදිතයටත් වඩා වැඩි ය. එමගින්, ගෝලීයකරණය මගින් සංවර්ධිත රටවල බහු ජාතික සමාගම් කිහිපයකට පමණක් බලය එකරාශි වී ඇති බව තහවුරු වේ. ඒ හේතුවෙන් සංවර්ධිත රටවල් කිහිපයකට පමණක් ආදායම එකරාශී වී දරිද්‍රතාවෙන් පෙළෙන සංවර්ධනය වෙමින් පවතින රටවල පුද්ගලයන් තවදුරටත් අසීරුතාවලට මුහුණ දී ඇත.

**වගු අංක 5: බහු ජාතික සමාගම්වල විකුණුම් සහ එකතු කළ අගය**

| රට | GDP (%) /විකුණුම් | GDP (%)/එකතු කළ අගය |
|---|---|---|
| ඉන්දියාව | 2.3 | 7.59 |
| පිලිපිනය | 0.38 | 1.254 |
| පකිස්ථානය | 0.31 | 1.23 |
| වියට්නාමය | 0.15 | 0.495 |

Source: World Investment Report 2000

ගෝලීයකරණ ප්‍රවාහය තුළ දී තාක්ෂණය ඉතා වැදගත් වේ. විශේෂයෙන් තොරතුරු සන්නිවේදනය කෙරෙන් පුද්ගලයන්ට තම සමාජ, ආර්ථික, දේශපාලන දැනුම වර්ධනය කර ගැනීම මගින් වඩා යහපත් ජීවන මට්ටමකට ළඟා වීමට අඩිතාලම සලසන බැවින් තොරතුරු තාක්ෂණයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. එහෙත් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල තාක්ෂණික පහසුකම් දෙස සංසන්දනාත්මක

අධ්‍යයනයක යෙදීමේ දී සංවර්ධනය වෙමින් පවතින රටවල් තාක්ෂණික විෂමතාවන්ට වඩාත් ගොදුරු වී ඇත. සංවර්ධිත රටවල සෑම පුද්ගලයන් දෙදෙනෙකුගෙන් එක් අයෙකුට ම දූරකථන පහසුකම් පවතින අතර ලෝකයේ දුප්පත් රටවල්වල පුද්ගලයන් 200 කගෙන් එක් අයෙකුට පමණක් දූරකථන පහසුකම් ඇත.

වගු අංක 6: පුද්ගලයන් 100ගෙන් අන්තර්ජාල පහසුකම් භාවිත කරන ප්‍රමාණය

| | 2002 | 2005 |
|---|---|---|
| උපසහරා අප්‍රිකාව | 1 | 3 |
| දකුණු ආසියාව | 2 | 5 |
| උතුරු අප්‍රිකාව | 3 | 8 |
| අග්නිදිග ආසියාව | 5 | 9 |
| නැගෙනහිර ආසියාව | 6 | 11 |
| බටහිර ආසියාව | 7 | 12 |
| ලතින් ඇමරිකාව හා කැරිබියන් දූපත් | 8 | 15 |
| ඕෂිවියාව | 4 | 5 |
| සංවර්ධනය වන කලාප | 4 | 9 |
| සංවර්ධිත කලාප | 43 | 53 |

Source: Millenium Development Goals Report 2007

2005 වර්ෂය අවසන් වනවිට, ලෝක ජනගහනයෙන් 15% ක ප්‍රමාණයක් අන්තර්ජාල පහසුකම භාවිත කරන අතර එම ප්‍රමාණයෙන් බහුතරය සංවර්ධිත රටවලට අයත් වෙති. සංවර්ධනය වන කලාපයේ අන්තර්ජාල පහසුකම භාවිත කරන පුද්ගලයන් 9% ක් වන අතර අඩුම සංවර්ධනයක් ඇති රටවල් 50 සලකා බැලීමේ දී එය 1% ක් පමණකි. ඒ අනුව ගෝලීයකරණය ශීඝ්‍රයෙන් පැතිරයාමට මූලික සාධකයක් ලෙස සන්නිවේදන දියුණුව සැලකුව ද සංවර්ධනය වෙමින් පවතින රටවලට සන්නිවේදන අවශ්‍යතාවන් සපුරා ගැනීමට නොහැකි වී ඇත. මේ හේතුවෙන් රැකියා, අධ්‍යාපන ඇතුළු සමාජ හා ආර්ථික අවස්ථාවන් පිළිබඳ ව තොරතුරු ලබා ගැනීමට නොහැකි වීමෙන් දරිද්‍රතාවෙන් මිදීමට නොහැකි වී ඇත (වගු අංක 6).

## විෂමතාව වර්ධනය වීම

ගෝලීයකරණය මගින් ආර්ථිකයන් වඩ වඩාත් බද්ධ වුව ද එහි සෘජු ප්‍රතිලාභ විශේෂයෙන් ඌන සංවර්ධිත රටවලට ව්‍යාප්ත වී නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයන්ගේ ජීවන තත්ත්ව පහළ දමමින් දරිද්‍රතාව තවදුරටත් වර්ධනය වී ඇත. 2000 වර්ෂය වනවිට ළමා ජනගහනය මිලියන 1658 කි. Child Population (2001) ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ ඔවුන් ද නොසලකා හැරිය හොහැකි වැදගත් සාධකයක්

වෙති. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ළමා පරපුර ගෝලීයකරණයේ ප්‍රතිලාභ බෙදීයාමේ විෂමතාව හේතුවෙන් වඩාත් අසාධාරණයට පත්ව ඇති ආකාරය 7 වගුව මගින් පැහැදිලි වේ.

**වගු අංක 7: සංවර්ධනය වෙමින් පවතින රටවල් තුළ ළමුන්ට ඇති අහිමිවීම**

| පහසුකම | | % |
|---|---|---|
| සනීපාරක්ෂක පහසුකම් | කිසිදු වර්ගයේ වැසිකිළි පහසුකම් නොමැති | 30.7 |
| ජල පහසුකම් | අනාරක්ෂිත ජල පහසුකම් පමණක් ආසන්නව පවතින | 21.1 |
| තොරතුරු පහසුකම් | රේඩියෝව , දුරකථන , පුවත්පත හෝ රූපවාහිනී වෙත ප්‍රවේශ වීමට නොහැකි | 16.1 |
| පෝෂණ තත්වයන් | අපේක්ෂිත පෝෂණ මට්ටමට පහළ සිටින | 16.1 |
| සෞඛ්‍යය පහසුකම් | ප්‍රතිශක්තීකරණය රහිත , පාචනයට ප්‍රතිකාර නොගත් | 14.2 |
| අධ්‍යාපන පහසුකම් | කිසිදා පාසලකට නොගිය | 13.1 |

Source: UNICE 2005

වයස් කාණ්ඩය : අධ්‍යාපන අවුරුදු 78 තොරතුරු අවුරුදු 3ට ඉහළ පෝෂණය අවුරුදු 5ට අඩු

ප්‍රමාණවත් සනීපාරක්ෂක හා ජල පහසුකම් අහිමි වීමෙන් ප්‍රතිශක්තිකරණය හීන වී මොවුහු නිරන්තරයෙන් වසංගත රෝගවලට ගොදුරු වෙති. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ළමා ජනගහනයෙන් ඉහළ ප්‍රතිශතයක් මන්දපෝෂණ තත්ත්වයෙන් පෙළෙන අතර රෝගාබාධ සඳහා අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් නොමැති අතර විධිමත් අධ්‍යාපනයට යොමු නොවීම හේතුවෙන් සංවර්ධනය වෙමින් පවතින රටවලට අනාගතයේ දී උග්‍ර මානව සම්පත් ගැටළුවකට මුහුණ දීමට සිදුවනු ඇත. විශේෂයෙන් තොරතුරු වෙත ළඟා වීමට පවතින දුෂ්කරතාව නිසා ළමුන්ගේ අධ්‍යාපනය වර්ධනය කිරීමට හා ඔවුන්ගේ අයිතිවාසිකම් හා අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමටත්, සමාජ කටයුතුවලට කාර්යක්ෂම ව දායක කර ගැනීමටත් නොහැකි වී ඇත.

ළමුන්ගේ යහපැවැත්මට දරිද්‍රතාව, සන්නද්ධ අරගල සහ රෝගවල ව්‍යාප්තිය ඉතා අහිතකර ලෙස බලපා ඇති ආකාරය 8 වගුව මගින් දක්වා ඇත. විශේෂයෙන් ලොව පුරා පවතින සිවිල් අරගල හේතුවෙන් පුද්ගලයන් මිලියන ගණනක් අවතැන් වෙති. 1990 සිට අරගල හේතුවෙන් පුද්ගලයන් මිලියන 3.6 ක ප්‍රමාණයක් මිය ගොස් ඇති අතර එම ප්‍රමාණයෙන් 45% ක් පමණ ළමෝ වෙති. ළමා සොල්දාදුවන්, ලිංගික අපයෝජන, අභ්‍යන්තර වශයෙන් අවතැන් වීම ආදිය සෘජු අහිතකර බලපෑම් වේ.

වගු අංක 8: ළමුන්ගේ යහපැවැත්මට දරිද්‍රතාව, සන්නද්ධ අරගල සහ HIV/ AIDS වල බලපෑම

| | ඌන සංවර්ධිත රටවල් | සංවර්ධනය වන රටවල් | සංවර්ධිත කලාපයේ රටවල් |
|---|---|---|---|
| 1990 ත් 2003 කාලය තුළ අවු: 5 ට අඩු මරණ සංඛ්‍යාව ඉහළ ගිය හෝ ස්ථාවර ව පැවති රටවල ප්‍රතිශතය | 24 | 17 | 4 |
| 2003 වර්ෂයේ අවු : 15 49 පුද්ගලයන් අතර ඉහළ HVI/ AIDS ආසාධිත තත්වයන් පැතිරයන රටවල ප්‍රතිශතය | 20 | 14 | - |
| වර්ෂ 1990 සහ 2003 කාල වකවානුවේ ප්‍රධාන සන්නද්ධ අරගලය පැවති රටවල ප්‍රතිශතය | 38 | 27 | 08 |

Source: UNICE 2005

ඒඩ්ස් රෝගය ලෙව පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින අතර ලොව පුරා වයස අවු: 15 - 49 පුද්ගලයන්ගේ මරණවලට ප්‍රබල හේතුවක් බවට පත් වී ඇත. 2003 වර්ෂයේ පමණක් HIV/AIDS හේතුවෙන් මිලියන 2.9 ක් මියගොස් ඇති අතර මිලියන 4.8 ක් නව ආසාදිතයන් ලෙස හඳුනාගෙන ඇත. HIV/AIDS රෝගයෙන් පෙළෙන 90% ක පුද්ගල ප්‍රමාණයක් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ජීවත් වෙති. උපසහරා අප්‍රිකාවල ළමා මරණ, අපේක්ෂිත ආයු ප්‍රමාණය ශීඝ්‍රයෙන් පහත යෑම සහ අනාථ දරුවන් ප්‍රමාණය වැඩි වීමට HIV/AIDS ප්‍රබල හේතුවක් වී ඇත.

ඉහත 7 සහ 8 වගු මගින් ලොව පුරා විසිරී සිටින ළමුන් මුහුණපාන දුෂ්කරතාවන් පැහැදිලි වේ. ධනවත් රටවල ළමා පරපුර අධිපෝෂණ තත්ත්වයන් නිසා පීඩාවට පත්ව සිටින අතරතුර සංවර්ධනය වෙමින් පවතින රටවල ළමුන් මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීමට නොහැකි ව ශාරීරික ව හා මානසික ව පීඩා විඳිති. ඒ අනුව ගෝලීයකරණය ප්‍රවාහය මගින් බොහෝ විට සංවර්ධිත රටවල් පමණක් තම ආර්ථික හා සමාජ සුභසාධනය වර්ධනය කරගැනීමට පමණක් අවධානය යොමු කර ඇති බව පැහැදිලි වේ.

තෝරා ගත් රටවල දත්ත පමණක් භාවිත කර ඇත. ළමා දුගී රේඛාව යනු සෑම පුද්ගලයෙකු සඳහා ම ගලපන ලද මධ්‍ය වැය කළ හැකි ආදායමෙන් සියයට 50කට වඩා අඩුවෙන ආදයම් ලබන කුටුම්භවලට අයත් දරුවන්ගේ ප්‍රතිශතය යි.


9 වගුව අනුව සංවර්ධිත රටවල දරුවන් පවා ගෝලීයකරණයේ ප්‍රතිලාභ බෙදීයාමේ විෂමතාව හේතුවෙන් පීඩාවට පත්වන බව තහවුරු වේ. දුගීභාවය ළමා මරණ හා

රෝගාබාධවලට මූලික පදනම වන අතර මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි බිලියන 1 ට වඩා වැඩි ළමෝ ලොවපුරා ජීවත් වෙති. ඔවුනගේ බහුතරය සංවර්ධනය වෙමින් පවතින රට වලට අයත් ය. අවුරුදු 5 ට අඩු ළමුන්ගේ 16% කට වඩා වැඩි ප්‍රමාණයකට ප්‍රමාණවත් පෝෂණයක් නොලැබෙන අතර 13% ක ප්‍රමාණයක් පාසල් අධ්‍යාපනයක් ලබා නොමැත. ඒ අනුව ගෝලීයකරණය ආර්ථික සහ සමාජ විෂමතාවන් වර්ධනයට කටයුතු කර ඇති බව තහවුරු වේ.

**වගු අංක 9: ( ආර්ථික සංවර්ධන සහ සහයෝගිතා සංවිධාන (OECD) රට වල ළමා දරිද්‍රතාව (ළමා දුගී රේඛාව (%)**

| රට | 1980 පසු හා 1990 ට පෙර | 1990 පසු හා 2000 ට පෙර |
|---|---|---|
| පින්ලන්තය | 2.3 | 2.8 |
| නෝර්වේ | 5.2 | 3.4 |
| ස්වීඩනය | 3.0 | 4.2 |
| බෙල්ජියම | 3.8 | 7.7 |
| හංගේරියාව | 6.9 | 8.8 |
| ලක්සම්බර්ග් | 5.0 | 9.0 |
| නෙදර්ලන්තය | 8.1 | 9.8 |
| ඔස්ට්‍රේලියාව | 4.8 | 10.2 |
| පෝලන්තය | 8.4 | 12.7 |
| කැනඩාව | 15.3 | 14.9 |
| එක්සත් රාජධානිය | 18.5 | 15.4 |
| ඉතාලිය | 14.0 | 16.6 |
| ඇමරිකාව | 24.3 | 21.9 |
| මෙක්සිකෝව | 24.7 | 27.0 |

Source: UNICE 2005





**රූප සටහන 5: ස්ත්‍රී පුරුෂ භාවය, පදිංචි ස්ථානය සහ කුටුම්භවල ධනවත්භාවය අනුව ප්‍රාථමික අධ්‍යාපනය නොලත් ළමුන්ගේ ප්‍රතිශතය (2005)**

Source: Millenium Development Goals Report 2007

පාසල් අධ්‍යාපනය අතරමඟ නවතා දැමීම හෝ දිනපතා පාසලට නොපැමිණෙන ළමුන් වාර්තා වනුයේ ග්‍රාමීය ප්‍රදේශවල දුගීභාවයෙන් පෙළෙන කුටුම්භ මගින් ය. සංවර්ධනය වන රටවල ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාථමික අධ්‍යාපනය ලැබිය යුතු වයසේ සිටින ළමුන්ගෙන් 3 න් 1 ක් පාසල් අධ්‍යාපනය වෙත යොමු නොවන අතර එය නාගරික ප්‍රදේශවල ජීවත්වන වයසේ පසුවන දරුවන්ගේ ප්‍රමාණයෙන් 18% කි. ස්ත්‍රී පුරුෂ භාවය අනුව ප්‍රාථමික අධ්‍යාපනය නොලබන්නන් අතර ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය ඉතා ඉහළ වේ. ගෝලීයකරණ ප්‍රවාහය තුළ ස්ත්‍රී පුරුෂ භාවය හේතුවෙන් අධ්‍යාපන සේවා නියුක්ති අවස්ථාවන් ලබා ගැනීමේ දී විවිධ විෂමතාවන්ට මුහුණ පෑමට සිදු වී ඇත (රූප සටහන 5).

විශේෂයෙන් සේවා නියුක්තියේ දී කාන්තාවන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා සඳහා සීමා කරමින් ශ්‍රමය සූරා කෑමට ලක් වී ඇත. අවුරුදු 15 ක කාලය තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්ගේ කෘෂිකාර්මික නොවන සේවා නියුක්තිය කැපීපෙනෙන ප්‍රතිශතයකින් ඉහළ ගොස් නැත. ඒ හේතුවෙන් කන්තාවන් අතර දරිද්‍රතාව ඉහළ වේ. ගෝලීයකරණය මගින් කාන්තා ශ්‍රමයට නිසි ස්ථානයක් හිමි නොවී ඇත (රූප සටහන 6).




**රූප සටහන 6: කෘෂිකාර්මික නොවන සේවා නියුක්ත කාන්තාවන්ගේ ප්‍රතිශතය 1990 - 2005**
Source: Millenium Development Goals Report 2007

සංවර්ධනය වෙමින් පවතින රටවල මාතෘ මරණ අනුපාතය ඉතා ඉහළ අගයක් ගනු ලබන අතර දකුණු ආසියාව සහ උපසහරා අප්‍රිකාව විශේෂයෙන් කැපී පෙනේ. සෑම වර්ෂයක ම 500,000 වැනි කාන්තාවන් ගර්භණී හෝ දරු උපත් අවස්ථාවේ දී වළක්වා ගත හැකි සංකූලතාවන් හේතුවෙන් මිය යනු ලැබේ. සුදුසුකම් ලත් වෛද්‍යවරුන්ගේ හෙදියන්ගේ සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ සහය ලබා ගැනීමට ඇති හැකියාවේ විෂමතාව රටවල් අතර මෙන් ම රටවල් තුළ ද දක්නට ලැබේ (වගුව 10).

1996 - 2005 කාලවකවානුව තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල දරු උපත් අවස්ථාවේ දී 57% ක් සුදුසුකම් පුද්ගලයන්ගේ සේවය ලබාගෙන තිබෙන අතර නාගරික අංශ එය 81% ක ඉහළ අගයක් වාර්තා කළ ද ග්‍රාමීය අංශයේ එම අගය 49% ක්වූ ඉතා පහළ අගයකි. ඒ අනුව ගෝලීයකරණ මගින් මූලික මිනිස් අවශ්‍යතාවක් වන සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම පිළිබඳ සංවර්ධන වෙමින් පවතින රටවල් විශාල ගැටළුවකට මුහුණ පා ඇත.

**වගු අංක 10: දරු උපත් අවස්ථාවල දී සුදුසුකම්ලත් පුද්ගලයන්ගේ සහය ලබාගැනීමේ ප්‍රතිශතය**

| කලාපය | 1990 | 2005 |
|---|---|---|
| දකුණු ආසියාව | 30 | 38 |
| බටහිර ආසියාව | 60 | 66 |
| උප සහරා අප්‍රිකාව | 42 | 45 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් | 43 | 57 |

Source: Millenium Development Goals Report 2007

ගෝලීයකරණ තුළ නාගරීකරණය සංක්‍රමණය සහ ඉහළ ජනගහන වර්ධනය හේතුවෙන් 2005 වර්ෂය වන විට නාගරික ජනතාවගෙන් 3 න් 1 මුඩුක්කුවල ජීවත් වෙති. 1990-2005 කාලපරිච්ඡේදය තුළ කැපී පෙනෙන ලෙස මුඩුක්කුවල ජීවත් වන නාගරික ජනගහනය අඩු වී නොමැත. ගෝලීයකරණ මගින් සංවර්ධනය වෙමින් පවතින රටවල පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීමට ධනාත්මක දායකත්වයක් ලබා දී නොමැත(වගුව 11).

**වගු අංක 11: මුඩුක්කුවල ජීවත්වන නාගරික ජනගහන ප්‍රතිශතය 1990-2005**

| කලාපය | 1990 | 2001 | 2005 |
|---|---|---|---|
| උපසහරා අප්‍රිකාව | 72 | 72 | 62 |
| නැගෙනහිර ආසියාව | 41 | 36 | 37 |
| දකුණු ආසියාව | 64 | 59 | 43 |
| බටහිර ආසියාව | 26 | 26 | 24 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් | 47 | 43 | 37 |

Source: Millenium Development Goals Report 2007

ගෝලීයකරණය සංවර්ධනය වන රටවල දරිද්‍රතාව හා ආදායම් ව්‍යාප්තියේ විෂමතාවන් වර්ධනය කිරීමෙන් ආර්ථික සහ සමාජ විෂමතාවන් වර්ධනයට කටයුතුකර ඇති බව තහවුරු වේ. ඒ අනුව ගෝලීයකරණය දුප්පතුන්ට හිතකර වර්ධනයක් (pro poor growth) සහිත ක්‍රියාත්මක විය යුතු ය.

## නිගමනය

ගෝලීයකරණය මගින් සංවර්ධිත රටවල ආර්ථික වර්ධනයට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල් ආයෝජන සහ අපනයන වර්ධනය කර ගනිමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගෙන ඇත. නමුත් ලොව පුරා ඇති වී තිබෙන සමාජ, ආර්ථික

ගැටළු හා පුද්ගලයින්ගේ ජීවන තත්වයන් පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙ දී දරිද්‍රතාව තව දුරටත් වර්ධනය වී ඇති ආකාරය එනම් ආර්ථික හා සමාජ විෂමතාවන්ගේ පරතරය ඉහළ දමා ඇති බව තහවුරු වේ.

ගෝලීයකරණ ක්‍රියාදාමය තුළ ආයෝජන සහ අපනයන වර්ධනයේ ප්‍රතිලාභ අභ්‍යන්තරයට ගලා යෑම පිළිබඳ විෂමතාවන් වර්ධනය වීම එයට මූලික වී ඇත. කෘෂිකාර්මික භාණ්ඩවල මිල අවිනිශ්චිතතාවන්, ලෝක ආර්ථික අවපාත , සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධිත රටවලට වඩා බාහිර ලෝකය මත යැපෙන තත්ත්වයක් නිර්මාණය වීම ඇතුළු ආර්ථික අවිනිශ්චිතතාවක් නිර්මාණය වීම බහුජාතික සමාගම්වල ක්‍රියාකාරීත්වයේ අසමානතාවන්, සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල තාක්ෂණික විෂමතාවන් මගින් රැකියා, අධ්‍යාපන ඇතුළු සමාජ හා ආර්ථික අවස්ථාවන් පිළිබඳ ව තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම ආදිය හේතුවෙන් දරිද්‍රතාව වර්ධනය වී ඇත.

විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් ගෝලීයකරණයේ ප්‍රතිලාභ බෙදීයාමේ විෂමතාව හේතුවෙන් වඩාත් අසාධාරණයට පත් ව ඇති ආකාරය එනම්, ප්‍රමාණවත් සනීපාරක්ෂක හා ජල පහසුකම් අහිමි වීම, ප්‍රතිශක්තිකරණය හීන වීම, මන්දපෝෂණ තත්ත්වයන්, තොරතුරු වෙත ළඟා වීමට පවතින දුෂ්කරතාව හා පාසල් අධ්‍යාපනය අහිමි වීම මෙන් ම කාන්තාවන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා සඳහා සීමා කරමින් ශ්‍රමය සූරා කෑමට ලක් කිරීම, සෞඛ්‍ය පහසුකම් නොමැති වීමෙන් මාතෘ මරණ ඉහළ යාම, මුඩුක්කුවල ජීවත් වන නාගරික ජනගහනය ඉහළ යාම ආදීය වර්ධනය වී ඇත. ඒ අනුව ගෝලීයකරණය දුප්පතුන්ට හිතකර වර්ධනයක් සහිත ව ක්‍රියාත්මක වී නොමැත.

## පරිශීලිත මූලාශ්‍රයෝ


Afriyie, K.O. ( 2008) Does Globalization Result in Poverty Reduction? SSRN: http://ssrn.com/abstract=1279400.

Agenor, P.R. (2002) Does Globalization Hurt the Poor?, World Bank Policy Research Working Paper No. 2922. SSRN: http://ssrn.com/abstract=636284.

Aisbett, E. (2004) Why are Critics So Convinced that Globalization is Bad for the Poor? Forthcoming in Globalization and Poverty, edited by Ann Harrison, National Bureau of Economic Research, Cambridge, Mass. Previously entitled Globaization, Poverty and Inequality: are the criticims vague, vested, or valid? avialable at http://are.berkeley.edu/~harrison/globalpoverty/.

Asia and Pacific Annual Statistical Book (2008) The United Nations Economic and Social Commission for Asia and Pacific ,United Nation publication,Thailand.

Dollar. D. (2004) Globalization, poverty and inequality since 1980 ,World bank policy research working papers 3333, http://www.wds.worldbank.org/servelt/WDSCntent/WDSP/IB

Harrison, A.E. (2006) Globalization and Poverty NBER Working Paper Series, Available at SSRN: http://ssrn.com/abstract=913310, v. w12347.

Heshmati, A. (2005) The Relationship between Income Inequality, Poverty, and Globalization, Working Papers RP2005/37, World Institute for Development Economic Research (UNU-WIDER). Available at ftp://repec.iza.org/RePEc/Discussionpaper/dp1277.pdf

Heshmati, A. (2006) Globalisation, Inequality and Poverty Relationships:A Cross Country Evidence, Discussion paper No.2223.

Ibrahim, F.A. (2008) Globalization, growth, and poverty: the missing link, Available at www.emeraldinsight.com/10.1108/03068290810854529.

Laurence, E.R. (2003) Globalization 101-The three tensions of globalization (http://www.globaled.org/issues/176.pdf).

Marcel, N. and Heshmati, A. (2006) Globalisation, Inequality and Poverty Relationships:A Cross Country Evidence, Discussion Paper No. 2223 ,available at http://ftp.iza.org/dp2223.pdf.

Millenium Development Goals Report (2007) Published by the United Nations Department of Economic and Social Affairs, New York, USA.

Petia, T. (2005) Trade Liberalization, Poverty, and Inequality: Evidence from Indian Districts , National Bureau of Economic Research, Inc in its series NBER Working Papers with number 11614, http://www.nber.org.

Ronald, P.H. and Justine, M.R. (2009) Globalization and Poverty: Oxymoron or New Possibilities?, Journal of Business Ethics, http://philpapers.org/rec/HILGAP.

Sindzingre, A.N. (2005) Explaining Threshold Effects of Globalization on Poverty: An Institutional Perspective Available at SSRN: http://ssrn.com/abstract.

United Nations Children's Fund (UNICEF) (2005) The State of the World's Children's, USA http://www.unicef.org/publications/files/SOWC_2005_(English).pdf , Accessed on 25th September 2009.

What is globalization? (2008) www.genderandhealth.ca/en/modules/globalization/globalization_what_is-01.jsp, Accessed on 18th December 2009.

William, C. (2003) Trading Up: Trade Policy and Global Poverty, CGD Brief 7, September 2003.Available at www.cgdev.org/files/2856_file_cgdbrief007.pdf

World Bank Report (2008) World Bank, USA.